සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
நலன்புரி நன்மைகள் சபை
WELFARE BENEFITS BOARD
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
Ministry of Finance, Economic Stabilaization & National Policies
මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

(53)

| මගේ අංකය / எனது இல / My No. | MF/WBB/02/Notice/D/Div./2022 | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2023.07.19 |
|---|---|---|---|---|---|

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත

<u>අස්වැසුම අභියාචනා හා විරෝධතා ඇතුළත් කිරීම සහ බැංකු ගිණුම් විවෘත කිරීමේ කටයුතු</u>

අස්වැසුම මූලික තේරීම් ලැයිස්තුව ප්‍රසිද්ධ කිරීමෙන් පසුව පුද්ගලයින් විසින් 2023.07.10 දින දක්වා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට භාරදුන් අභියාචනා හා විරෝධතා පරිගණක පද්ධතියට ඇතුළත් කිරීමේ කටයුතු **2023.07.20** වන දිනය අවසාන වන විට අවසන් කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

අභියාචනා හා විරෝධතා පරීක්ෂණ කටයුතු කඩිනමින් ආරම්භ කිරීමට සහ ප්‍රතිලාභී දීමනා ගෙවීම් කටයුතු කඩිනමින් ආරම්භ කළයුතුව ඇති බැවින් ඉහත සඳහන් දිනට පසුව අභියාචනා හා විරෝධතා ඇතුළත් කිරීමට කාලය ලබාදීමට ඉඩක් නොමැති බව සලකන්න.

තවද බැංකු ගිණුම් විවෘත කිරීමට නියමිත පුද්ගලයින් සඳහා ලිපි නිකුත්කර ගිණුම් විවෘත කිරීමේ කටයුතු ද කඩිනම් කළයුතු බවද අවධාරණය කරමි. එම කටයුතු සාර්ථක කර ගැනීම සඳහා අදාළ ලිපි ප්‍රාදේශීය ලේකම් හෝ සහකාර ප්‍රාදේශීය ලේකම් වැනි බලයලත් නිලධාරියෙකු විසින් අත්සන් හා මුද්‍රාව තබා නිකුත් කිරීමට පියවර ගන්නා මෙන් ද ඉල්ලමි.

මෙම ලිපි නිකුත් කිරීමේදී සහ පවත්නා ගිණුම් සම්බන්ධයෙන් යම් විශේෂිත ගැටළු ඇති අවස්ථාවන් අප වෙත විද්‍යුත් තැපැල් මගින් හෝ නිශ්චිත තොරතුරු සහිතව වාර්ථා කරන ලෙසද ඉල්ලමි.

මේ සම්බන්ධයෙන් ඔබෙන් ලැබෙන සහයෝගය ඉතා අගය කොට සලකමි.

ආර්.පී.ආර්. රාජපක්ෂ
අතිරේක කොමසාරිස්(මෙහෙයුම්)
කොමසාරිස් වෙනුවට

කාර්යාලය / அலுவலகம் / Office: Tel: 009411-2151481, 009411-2484600/4117, Fax: 009411-2151482
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / e-mail: welfarebenefitboard2016@gmail.com, info@iwms.wbb.gov.lk
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.wbb.gov.lk